යම් පුද්ගලයෙකු විසින් සිය පවුලේ සාමාජිකයෙකු හෝ වෙනත් අයෙකුව ඝාතනය කොට, ඉන් අනතුරුව තමන්ද දිවි අහිමි කරගත් අවස්ථාවන් සුලභ නොවනා'මුත්, ඊට මාධ්‍ය මගින් වඩාත් ඉහළ අවධානයක් ලබාදීමේ සම්භාවිතාවක් තිබේ. එනිසාම, එවැනි අවස්ථාවන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ ආචාර ධර්මයන් පිළිපැදීම සහ මනා ප්‍රවේසම් සහගත ප්‍රවේශයක් අවශ්‍ය වේ.

එවැනි සිදුවීමක් ආචාර ධර්ම පිළිපදිමින් සහ පිළිනොපදිමින් වාර්තා කළ අවස්ථාවන් කිහිපයක් මීට උදාහරණ ලෙසින් අපි ඉදිරිපත් කරමු. අරුණ (02/16) පුවත්පතේ මේ සම්බන්ධයෙන් වූ පුවත් වාර්තාව තුළ දිවි අහිමි කරගැනීමට තැත් කළ ආකාරය දක්වා ඇති අතර, දිවි අහිමි කරගැනීමට තැත් කිරීමේ හේතුව සරලව දක්වා ඇත. එසේම එම පුවත මුල් පිටුව තුළ ප්‍රමුඛ අවධානයකට ලක්වන ආකාරයෙන්ද පළ වී ඇත. එසේම උපකාරක අංකද සඳහන් වී නැත.

කෙසේ නමුත් මෙම ප්‍රවෘත්තියම ඉදිරිපත් කරනා අද (02/17) සහ මව්බිම (02/17) පුවත්පත් මගින් මෙම සිදුවීම ඝාතන තැතක් ලෙසින් පමණක් ඉදිරිපත් කොට ඇති අතර, දිවි අහිමි කරගැනීමට තැත් කළ තැනැත්තියගේ ක්‍රියාව අන්තර්ගතය තුළ ප්‍රමුඛ නොවන තොරතුරක් ලෙසින් පමණක් දක්වා ඇත.

මෙවැනි පුවතක් වාර්තා කිරීමේදී මාධ්‍ය කෙතරම් දුරට ප්‍රවේසම් විය යුතුද යන්න වටහා ගැනීමට මෙම පුවත් වාර්තාවන් මනා උදාහරණයක් සපයනු ඇත. ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://media.samaritans.org/documents/Media_Guidelines_FINAL_v2_TABa8C6.pdf
https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Mawbima #Ada